**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත**

9 ශ්‍රේණිය - පුරවැසි අධ්‍යාපනය

**ඒකකය 9.3 - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය**

**පැවරුම් අංක 6 - 8 වන සතිය (2021.07.26-2021.07.30)**

**ක්‍රියාකාරකම 9.3.5 -** ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු ලෙස අවස්ථාවෝචිතව ස්ථිරසාර භාවයෙන් කටයුතු කිරීම.

**හැඳින්වීම -** කටුක අභියෝගාත්මක අවස්ථාවක නොබියව, අවංකව, ඍජුව හා හෘද සාක්ෂියට එකඟව අවස්ථාවට ගැළපෙන පරිදි සදාචාරාත්මකව තම අදහස අවශ්‍යතාවය හෝ බලාපොරොත්තුව ස්ථිර ලෙස ප්‍රකාශ කිරීම ස්ථිරසාරභාවයයි.

ස්ථිරසාර ලෙස කටයුතු කිරීමට සිදු වන අවස්ථා:-

උදාහරණ

- යම් අසාධාරණයක් වූ විට
- අසත්‍ය චෝදනාවක් එල්ල වූ විට
- කෝපයට පත් වූ පුද්ගලයකු සමඟ කතා කරන විට

මෙහිදී තම සිත තුළ ඇති වන අයහපත් සිතුවිලි තමා විසින්ම මැඩ පවත්වා ගැනීම අදහස් කරයි.

**ගුණාත්මක යෙදවුම් -** පෙළ පොත /පෑන් /අභ්‍යාස පොත /ස්ථිරසාර ගුණාංග දැක්වෙන පොත් /පත්තර

**ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස්**

පියවර 1 - පෙළ පොතේ පිටු අංක 84 - 85 කියවන්න.

පියවර 2 - අභ්‍යාස පොත භාවිත කර ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න.

**ප්‍රශ්නාවලිය**

1. තිරසාරභාවය යනු කුමක්දැයි අර්ථ ගන්වන්න.
2. ස්ථිරසාර භාවය ගොඩනගා ගැනීම සඳහා පුද්ගලයකු තුළ වර්ධනය කරගත යුතු ගුණාංග පෙළගස්වන්න.
3. තමා සමග ස්ථිරභාවයෙන් කටයුතු කළ යුතු ආකාරය කරුණු තුනකින් පැහැදිලි කරන්න.
4. අනුන් සමග ස්ථිරභාවයෙන් කටයුතු කළ යුතු ආකාරය කරුණු තුනකින් පැහැදිලි කරන්න.
5. ක්‍රියාකාරකම 3.4 කරන්න.

**පසු වැඩ**

පහත සඳහන් අවස්ථාවලට ඔබට මුහුණදීමට සිදුවුවහොත් ඔබ ස්ථිරසාර ලෙස කටයුතු කරන්නේ කෙසේද?

1. පාසලේ කිසියම් කාලච්ඡේදයට සහභාගි නොවී සිටීමට යහළුවෙකු විසින් ඔබට යෝජනා කරනු ලැබූ අවස්ථාවක.
2. සන්ධ්‍යා කාලයේ දී ආගමික වතාවත්වල යෙදෙන විට ඔබගේ සහෝදරයා රූපවාහිනියේ අධික ශබ්දයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම.
3. පන්තියේ යාළුවකු නියමිත දිනට පිරිසුදු කිරීම නොකර මග හැර සිටීම.
   (කෙටි පිළිතුරු සපයන්න)

ඉදිරිපත් කිරීම
ර/ ශ්‍රී රත්නාකර මහා විද්‍යාලයේ පුරවැසි අධ්‍යාපන විෂය භාර
ආචාර්ය එම්.ඒ.පත්මලතා මිය